**ශ්‍රී ලංකා නිරිතදිග නාගරික සෞඛ්‍යාරක්ෂණ හා සනීපාරක්ෂණ මූලපිරීම් ව්‍යාපෘතිය (අදියර 01) - 2018**

-----------------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා නිරිතදිග නාගරික සෞඛ්‍යාරක්ෂණ හා සනීපාරක්ෂණ මූලපිරීම් ව්‍යාපෘතියේ (අදියර 01) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ඒජන්ස් ෆ්‍රැන්සස් ඩී ඩිවෙලොප්මන්ට් අතර 2018 ජුනි 01 දින එළඹි අංක සීඑල්කේ 1013 – 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමෙි 3.4.3 (එච්) වගන්තිය සහ 2016 මාර්තු 16 දින එළඹි අංක සීඑල්කේ 1013-02 එල් දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, අප ජලය රැස්කිරීම හා පිරිසිදු කිරීමේ පද්ධති ව්‍යාප්ත කිරීම හා 73,000 ක් වූ ජනතාව සඳහා සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම, දිළිඳු හිතකාමී ප්‍රතිපත්ති හා උපාය මාර්ග සංවර්ධනය කිරීම මඟින් අවාසි සහගත නිවැසියන් සඳහා සේවා ප්‍රවේශයට පහසුකම් සැලසීම සහ වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්ව පවත්වා ගැනීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,739.81 කට සමාන යූරෝ මිලියන 107.70 ක් වන අතර ඉන් රු.මිලියන 13,224 කට සමාන යූරෝ මිලියන 76 ක් ණයක් වශයෙන් සහ රු.මිලියන 991.81 කට සමාන යූරෝ මිලියන 5.70 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යයනය කිරීමට ඒජන්ස් ෆ්‍රැන්සස් ඩි ඩිවලොප්මන්ට් එකඟ වී තිබුණි. රු.මිලියන 4,524 කට සමාන ඉතිරි යූරෝ මිලියන 26 ක ශේෂය ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ

නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) ව්‍යාපෘතියෙ මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනට ආපසු ගැනීම් එකතුව රු මිලියන 159.21 ඉල්ලුම් කර තිබුණි. කෙසේ වුවද විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අදාල වාර්තා අනුව ආපසු ගැනීම් වටිනාකම් රු.මිලියන 95.11 වී තිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතාවයකි. | ණය හා ප්‍රදාන යන දෙකින් ම ආපසු ගන්නා ලද වටිනාකම වූ රු. මිලියන 59.21 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ. ආපසු ගැනීම් රු. මිලියන 95.18 ක් පමණක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවල ඇතුලත් වේ. | අගයන් සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශනවල නිසි පරිදි හෙළිදරව් කළ යුතුය. |
| (ආ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ව්‍යාපෘතියේ කෙරී ගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 57.45ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව කෙරීගෙන යන වැඩ වටිනාකම රු. මිලියන 110.53 ක් විය. | අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතාවයකි. | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | අගයන් කාලීනව සැසඳීම් කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය

මීගමුව ප්‍රදේශයේ සනීපාරක්ෂක යටිතල පහසුකම් වර්ධනය කිරීම, සනීපාරක්ෂක ප්‍රතිපත්ති සැකසීම සහ මීගමුව,ගාල්ල හා කැළණිය ප්‍රදේශවල සනීපාරක්ෂක යටිතල පහසුකම් සැලසුම් කිරීම යන ප්‍රධාන සංරචක 03 කින් ව්‍යාපෘතියේ කාර්යය සමන්විත වේ. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කලමනාකරණ සමාජ සේවා සඳහා වන උපදේශන සේවා කොන්ත්‍රාත්තුව සහ ඉදිකිරීම් කාර්යය සැලසුම් කිරීම හා අධීක්ෂණය සඳහා වන උපදේශන සේවා කොන්ත්‍රාත්තුව හැරුනු කොට, උපදේශන සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි. තවද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මීගමු ප්‍රාද්ශයේ ඉඩම් කොටස් දහයක අත්පත් කරගැනීම් කටයුතු 2018 දෙසැම්බර් 31 දින වනවිටත් කෙරී ගෙන යමින් පැවතුණි.

### 3.2 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අගය දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| --------------------- | -------- | -------------------- | ---------------------- |
| මුදල් රෙගුලාසි 133 සහ 2016 ජූනි 10 දිනැති කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කලමනාකරණ විගණන චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | මූල්‍ය පාලනයේ දුර්වලතාවයකි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතියේ අරමුදල් කාර්යක්ෂමව බෙදා හැරීම සහතික වීම සඳහා අභ්‍යන්තර විගණනකගේ සහය ලබා ගත යුතු වේ. |